ඔබට මා ලම් යකුනිල්ලදීන කෆරූ පාරායනය කරන මෙන් නියත වශයෙන්ම අල්ලාහු -අස්ස වජල්ල- මට අණ කළේය.

අල්ලාහ්ගේ දූතයාණන් -සල්ලල්ලාහු අලය්හි වසල්ලම්-උබය් ඉබ්නු කඃබ් -රළියල්ලාහු අන්හු- තුමාට ((ඔබට මා ලම් යකුනිල්ලදීන කෆරූ පාරායනය කරන මෙන් නියත වශයෙන්ම අල්ලාහු - අස්ස වජල්ල- මට අණ කළේය.)) යැයි පැවසූ බව අනස් ඉබ්නු මාලික් -රළියල්ලාහු අන්හු- තුමා විසින් වාර්තා කරන ලදී.එවිට උබය් බ්න් කඃබ් -රළියල්ලාහු අන්හු- තුමා මාගේ නම සඳහන් කරමින් කීවේද යනුවෙන් අසා සිටියහ.එවිට නබි -සල්ලල්ලාහු අලය්හි වසල්ලම්- එසේය
යනුවෙන් පැවසූ පමණින් උබයි බින් කඃබ් -රළියල්ලාහු අන්හු- තුමා අඩන්නට විය.වෙනත් වාර්තාවක උබයි බින් කඃබ් -රළියල්ලාහු අන්හු- තුමා හැඬීමට පටන් ගත්හ යනුවෙන් සඳහන්
වේ.
[පූර්ව සාධක සහිත හදීසයකි] [ඉමාම් බුහාරි එය වාර්තා කර ඇත - බුහාරි හා මුස්ලිම් හි වාර්තා වී ඇත]

නිය වශයෙන්ම උබෙයි තුමාට සූරා බය්යිනා පාරායන කර පෙන්වන මෙන් නබි -සල්ලල්ලාහු අලය්හි වසල්ලම්- තුමා වෙත අල්ලාහ් දන්වා සිටි බව මෙම හදීසයෙහි සඳහන්ව ඇත. එවිට උබෙයි - රළියල්ලාහු අන්හු- මෙය කෙසේනම් විය හැකි දැයි මවිතයට පත් විය. හේතුව යථාර්ථය වනුයේ භාග්ය ලත් පුද්ගලයා භාග්යවන්තයාට පාරායනා කිරීමය. භාග්යවන්තයා භාග්ය ලත් පුද්ගලයාට පාරායනය කිරීම නොවේ. අල්ලාහ් උබෙය් තුමාගේ නාමය විශේෂයෙන් සඳහන් කර ඇති බවට නබි - සල්ලල්ලාහු අලය්හි වසල්ලම්- තුමාගෙන් ඔහු තහවුරු කර ගත් කල්හි එතුමාගෙන් ස්ථීර කර ගත් කල්හි ඔහුගේ නාමය නම් කරමින් සඳහන් කර ඇති බැවින් සොම්නසින් හා සතුටින් අඩන්නට විය.

http://sunnah.global/hadeeth/si/show/3601